# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1986/43 - 2016 සැප්තැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විනිමය පාලන පනතේ 22(4) වගන්තිය ප්‍රකාරව වූ අවසරය**

විනිමය පාලන පනතේ 3 වගන්තිය සමග කියැවෙන එකී පනතේ 22(4) වගන්තිය යටතේ, 2016 අගෝස්තු 01 සිට බලපැවැත්වෙන පරිදි:

1. භාණ්ඩ අපනයනය වෙනුවෙන් ලද ආදායම්, එම අපනයනය කිරීමේ දින සිට දින 120 ක් ඇතුළත ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතු බවත්;

2. දින 120 සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මෙම නියෝගය උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දින 30 ක සහන කාලයක් ලබා දිය හැකි බවත්;

3. සෑම අපනයනයකටම අදාළ ලේඛනගත සාක්ෂි, ගෙවීම ලබාගන්නා බලයලත් වෙළෙන්දා හෝ වෙනත් අවසරලත් ආයතනයක් වෙත ඉදිරිපත් කළ යුතු බවත්;

භාණ්ඩ අපනයනකරුවන් වෙත මෙමගින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු,
විනිමය පාලක.

2016 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

10 - 374


1A - G 24294 — 27 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*